# Asia Floor Wage Alliance

## <u>එක්සත් ජනපද තීරුබදු මිලියන ගණනක් ඇඟලුම් අංශයේ කම්කරුවන්ට තර්ජනයක් වන බැවින් Asia Floor Wage Alliance සන්නාමයන්හි වගවීම ඉල්ලා සිටී</u>

*ජූලි 2025*

ආසියාව පුරා ඇඟලුම් කම්කරුවන් නියෝජනය කරන වෘත්තීය සමිති සන්ධානයක් වන Asia Floor Wage Alliance (AFWA), කම්කරුවන්ගේ අවශ්‍යතාවලට තර්ජනයක් වන සහ ගෝලීය අසමානත්මතා තීව්‍ර කරන වෙළඳ ප්‍රතිපත්තිවලට එරෙහිව එක්සත්ව නැඟී සිටී. ආසියාවෙන් ආනයනය කරන ඇඟලුම් සඳහා මෑතකදී එක්සත් ජනපද රජය විසින් තීරුබදු පැනවීම, ප්‍රධාන වශයෙන් දැනටමත් දරිද්‍රතා මට්ටමේ වැටුප් ලබන කාන්තාවන් ඇතුළු මිලියන සංඛ්‍යාත ඇඟලුම් සේවකයින්ගේ ජීවනෝපායන් අනතුරේ හෙළයි.

තීරුබදු පැනවීම, COVID-19 වසංගතය අතරතුර සමූහ රැකියා කප්පාදු, කම්හල් වසාදැමීම්, වැටුප් මංකොල්ලයන් සහ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර තීව්‍ර වීමට ඉඩ සලසමින් ගෝලීය වෙලඳ සන්නාම තම වගකීම් වලින් ඉවත්වූ අවස්ථාවේ ඇතිවූ පරිමාණයෙන් මානුෂීය අර්බුධයක් අවුලුවාලීමේ අවදානමක් ඇත. භූ දේශපාලනික උපාමාරුවල පිරිවැය, තව තවත් විරැකියාවට සහ තීව්‍ර වන දරිද්‍රතාවයට මුහුණ දෙමින් දරනු ලබන්නේ බහුතරයක් කාන්තාවන්ගෙන් සමන්විත ඇඟලුම් කම්කරුවන් විසිනි. එය එසේ තිබියදීත්, වෙළඳ නාම මිනිසුන්ට වඩා ලාභ ඉපැයීමට අඛණ්ඩව ප්‍රමුඛත්වය දෙමින් සිටී.

"භූ දේශපාලනික ගැටුම්වලදී තීරුබදු ආයුධයක් ලෙස භාවිතා කළ නොහැක. බරපතල මානව ප්‍රතිවිපාක ඇති කරන මෙම දඬුවම්කාරී තීරුබදු පැනවීම අපි ප්‍රතික්ෂේප කරමු," AFWA හි නියෝජ්‍ය ජාත්‍යන්තර සම්බන්ධීකාරක විරන්ත ගින්ටිං පවසයි. "බාහිරගත නිෂ්පාදන වලින් ලාභ ලබන සන්නාමවලට, මෙම තීරුබදු වෙනස්වීම් කර්මාන්තශාලා වසාදැමීම් හෝ මහා පරිමාණ රැකියා කප්පාදුවන්ට තුඩුදෙමින් සිටින මොහොතක නිශ්ශබ්දව හෝ නිෂ්ක්‍රීයව සිටිය නොහැක."

යුක්තිගරුක සහ සාධාරණ ගෝලීය ඇඟලුම් අංශයක් නිර්මාණය කිරීම සඳහා, ඇඟලුම් කර්මාන්තයේ ගෝලීය වෙළඳාම නැවත හැඩගැස්වීමේදී මූලික පදනම ලෙස සැළකිය යුතු මූලික මූලධර්ම හතරක් අපි ඉදිරිපත් කරමු:

### 1. තීරුබදු අවියක් ලෙස භාවිතා කිරීම ප්‍රතික්ෂේප කිරීම

තීරුබදු යනු රාජ්‍ය ආදායම සහ රාජ්‍ය මූල්‍ය ධාරිතාව ඉහළ නැංවීමේ සාමාන්‍ය විධික්‍රමයකි. නමුත් ගෝලීය නිෂ්පාදන ආර්ථිකයේ සන්දර්භය තුළ, තීරුබදු සම්බන්ධව තවත් සුවිශේෂී ඉලක්ක දෙකක් තිබිය හැකිය:

i. කම්කරුවන්ට සාධාරණත්වය සහ රැකියා අවස්ථා ලබා දීම සඳහා නිෂ්පාදනය ප්‍රතිව්‍යුහගත කිරීම.
ii. තෝරාගත් ආර්ථිකයන් මත භූ දේශපාලනික දණ්ඩනීය පියවරයන් පැනවීම.

පළමුව සඳහන් කළ කරුණට අනුව, තීරුබදු මගින් ඇඟලුම් නිෂ්පාදනය ඇමරිකා එක්සත් ජනපදයට මාරු කර එහි සේවකයින්ට රැකියා අවස්ථා ලබා දිය හැකි නම්, කම්කරුවන්ගේ යහපත සළකා එවැනි මාරුවක් උචිත යැයි යමෙකුට තර්ක කළ හැක. කෙසේ වෙතත්, ඇඟලුම් නිෂ්පාදනය එක්සත් ජනපදයට මාරු කිරීම සිදුකළ හැකි තත්වයක් අද වනවිට නොමැත. නිෂ්පාදන පිරිවැයේ ඉහළ යාම හේතුකොටගෙන ඇඟලුම් පරිභෝජනය ඇමරිකා එක්සත් ජනපදයේ සහ ලෝකයේ වෙනත් ඕනෑම තැනක පාරිභෝගිකයින්ට ළඟා විය නොහැකි මට්ටමට  නිෂ්පාදන වල මිල ඉහළ යනු ඇත. ඇමරිකා එක්සත් ජනපදයේ ඇඟලුම් අංශයේ තීරුබදු මඟින් ඇඟලුම් නිෂ්පාදනය සැලකිය යුතු ලෙස නැවත එක්සත් ජනපදයට ගෙන ඒමට හේතු විය නොහැක. එවැනි තීරුබදුවලට ඇත්තේ එක් ඉලක්කයක් පමණි - විනිවිද නොපෙනෙන භූ දේශපාලනික ඉලක්ක සඳහා දණ්ඩනීය පියවර ගැනීම.

AFWA දණ්ඩනීය තීරුබදු ප්‍රතික්ෂේප කරයි. තීරුබදු භූ දේශපාලනික ගැටුම් හැසිරවීමට අවියක් ලෙස භාවිතා කළ නොහැක.

## **2.** තීරුබදු ගැලපීම් සමානුපාතික හා සාධාරණ විය යුතුය.

තීරුබදු යෙදවීමට සිදුවන්නේම නම්, ඒවා සමානුපාතික හා සාධාරණ විය යුතුය. කලාපය තුළ සමහර රටවලට වඩා අනෙක් රටවලට වාසිදායක වන ආකාරයෙන්, පවතින වෙළඳ ව්‍යාප්තිය විකෘති කරන ඕනෑම තීරුබදු ප්‍රතිපත්තියක් AFWA ප්‍රතික්ෂේප කරයි. අසමානුපාතික තීරුබදු ව්‍යුහයක් මඟින් ආසියාවේ නිෂ්පාදන පදනම අස්ථාවර වීමේ අවදානමක් ඇති කරයි. බොහෝදුරට මෙම අවස්ථාවන් නිෂ්පාදන සැපයුම් දාමයේ පහළ ස්ථරයන්හි පිහිටීම සහ කම්කරු නීතීන්ට අනුකූලතාවය දැක්වීම අඩු නිසාවෙන් සුළු වැටුප් සහිත රැකියාවන් උත්පාදනයට හේතු වුවත්, ගෝලීය නිෂ්පාදන ජාලයන් සැබවින්ම සංවර්ධනය වෙමින් පවතින රටවල කාර්මික පදනම් පුළුල් කිරීමට අවස්ථාව සලසා දී ඇත.

යෝජිත තීරුබදු, අන්තර්කරණය සහ තිරසාර වර්ධනයක් වෙනුවෙන් මෙහෙයුම්කාරක ලෙස ක්‍රියාත්මක වන ගෝලීය නිෂ්පාදන ජාලය විකෘති කරනු ඇත. තීරුබදු ව්‍යුහය භාණ්ඩවල පාදක මිලට සමානුපාතික විය යුතු අතර, එ.ජ. වෙළඳපොලේ දැනට එක් එක් රටවල් අත්කරගෙන ඇති වර්තමාන කොටස් අනුපාතය එලෙසම පවත්වාගෙන යෑමට හෝ ඊට දැඩි ලෙස බාධා නොකිරීමට වගබලා ගත යුතුය. ආසියාවේ ඇඟලුම් ශ්‍රම බලකාය අතර බෙදීමක් ඇතිකිරීමට හෝ ඔවුන් අතර සෘණාත්මක තරඟකාරිත්වයක් ඇති කිරීමට තීරුබදු ප්‍රතිපත්ති භාවිතා නොකළ යුතුය. කලාපයේ ශ්‍රමයේ සාමූහික වටිනාකම වටා කම්කරුවන් එක්සත් විය යුතු අතර වෙළඳ ස්ථායිතාව රැකගත යුතුය.

## **3.** තීරුබදු ආදායම කම්කරුවන් සඳහා වන සමාජ ආරක්ෂණ වෙනුවෙන් යෙදවීම

නිෂ්පාදන අංශවල අඩුම වැටුප් ලබන්නේ ඇඟලුම් සේවකයින් අතර වන අතර, ගෝලීය වෙළඳපොළ සඳහා ඇඟලුම් වලින් වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ලබන්නේ ආසියාවයි. සංඛ්‍යාත්මකව, විශාලතම වැඩ කරන දුප්පතුන් ප්‍රමාණය සිටින්නේ ආසියාවේයි. දරිද්‍රතා මට්ටමේ වැටුප් සමඟ, කාන්තා ඇඟලුම් සේවිකාවන් එදිනෙදා ජීවිතය ගැට ගසා ගැනීමට අරගල කරති.

එක්සත් ජනපද රජය විසින් පනවන ලද තීරුබදු ඔවුන්ගේ ආදායම වැඩි කරනු ඇත. නමුත් ඒවා ගෝලීය නිෂ්පාදන ජාල මත පනවන ලද බදු අය කිරීමේ ආකාරයක් වන අතර එය එසේ හඳුනාගත යුතුය. යුක්තිය සැලසීම මුල්කරගනිමින්, AFWA ඉල්ලා සිටින්නේ, ඇඟලුම් ගෝලීය සැපයුම් දාමයන් මත බදු පැනවීම හරහා එක්සත් ජනපද රජය විසින් ලබා ගන්නා ලද තීරුබදු ආදායම සාධාරණ ලෙස බෙදී යා යුතු බවයි. **තීරුබදු ආදායමෙන් අවම වශයෙන් 50% ක්** ඇඟලුම් සේවකයින් සඳහා වන **සමාජ ආරක්ෂණ අරමුදලක්** ලෙස නිෂ්පාදන රටවල් සමඟ බෙදා ගත යුතුය. දණ්ඩනීය තීරුබදුවල විනාශකාරී බලපෑම අවම කිරීම සඳහා මෙය මගක් වනු ඇත. තීරුබදු ආශ්‍රිත බාධාවන් නිසා ඇතිවන රැකියා කප්පාදු කිරීම්, කම්හල් වසාදැමීම් හෝ නිෂ්පාදන මාරුවීම් හමුවේ මෙම අරමුදල තීරණාත්මක සහායක් ලබා දිය යුතුය.

තවද, වෙළඳ පාලන තන්ත්‍රයන් ද්විපාර්ශ්වික ගිවිසුම් මඟින් මෙය ආයතනිකකරණය කළ යුතු අතර, මෙම සමාජ ආරක්ෂණ අරමුදල නිර්මාණය කිරීමේදී රජයන් කාර්යභාරයක් ඉටු කළ යුතුය.

## 4. සේවක වන්දි සඳහා වෙළඳ නාමයන්හි වගවීම:

වෙළඳ නාම සැපයුම් කර්මාන්තශාලාවලින් ඉවත් වන විට එහි ප්‍රතිඵලය ක්ෂණික වන අතර කම්කරුවන්ට විනාශකාරී ලෙස බලපායි. අනතුරු ඇඟවීමක් හෝ යැපීමට කිසිදු ආදායමක් නොමැති කරමින් මුළු ශ්‍රම බලකායම සේවයෙන් පහකර දමයි. මෙම ඉවත්ව යාමේ ක්‍රමවේදය ගෝලීය ඇඟලුම් සැපයුම් දාමවල පුනරාවර්තන රටාවක කොටසක් ලෙස දැකිය හැකි අතර මෙහිදී වෙළඳ නාම තමන්ව අවදානමෙන් ආරක්ෂා කර ගනිමින් ප්‍රතිවිපාක කම්කරුවන් මතට තල්ලු කරනු ලැබේ.

COVID-19 අර්බුදය අතරතුර අපි මෙය පැහැදිලිව දුටුවෙමු: වෙළඳ නාම එක රැයකින් ඇණවුම් අවලංගු කළ අතර ඇඟලුම් නිෂ්පාදන රටවල් පුරා සැපයුම් කර්මාන්තශාලා අතහැර දමන ලදී. මිලියන ගණනක් කම්කරුවන් - ඔවුන්ගෙන් වැඩි දෙනෙක් කාන්තාවන් - වැටුප්, වන්දි හෝ කිසිදු ආකාරයක සහයෝගයක් නොමැතිව අසරණ විය. ක්ෂණික ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක නොකළහොත්, තීරුබදු හේතු කරගෙන වෙළඳ සන්නාමයන් ඉවත්වීම හරහා දැන් නැවත ඒ හා සමාන හානියක් සිදුවිය හැකි අවදානමක් පවතී.

**AFWA හි කලාපීය කේවල් කිරීමේ ආයතනය වන Asia Brand Bargaining Group (ABBG) සමඟ සාකච්ඡා නොකර කිසිදු වෙළඳ නාමයක් කර්මාන්ත ශාලාවකින් ඉවත් නොවිය යුතුය.** මෙහිදී අවස්ථා දෙකක් මතු විය හැකිය:

i. වෙළඳ නාමයක් ඉවත් වීමෙන් **කර්මාන්තශාලාවක් සම්පූර්ණයෙන්ම වසා දැමීමට සිදු වූ විට**, සේවකයින්ට ඔවුන්ගේ සේවා කාලය සඳහා සම්පූර්ණයෙන්ම වන්දි ලබා දිය යුතු අතර හදිසි විරැකියාවකට මුහුණ දීමට සිදු නොවිය යුතුය. වන්දි කාලෝචිත, විනිවිද පෙනෙන සහ ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල විය යුතු අතර සැපයුම් රටවල් සහ සමාගම් සමඟ පවත්නා ඔවුන්ගේ ව්‍යාපාරයේ මට්ටමට සමානුපාතිකව වෙළඳ නාම විසින් ගෙවිය යුතුය.

ii. **වසා දැමීම අර්ධ වශයෙන් සිදුවන අවස්ථාවන්හිදී -** රැකියා කප්පාදු, වැඩ පැය ගණන අඩු කිරීම හෝ වැටුප් කප්පාදුවලට හේතු වන අවස්ථාවන්හිදී වුවද සේවකයින්ව ආරක්ෂා කළ යුතුය. ඇණවුම් අඩු කිරීම හේතුවෙන් තාවකාලික සේවය අත්හිටුවීම් වලට මුහුණ දෙන සේවකයින්ට සම්පූර්ණ සේවය අත්හිටවා ඇති කාලය පුරා ඔවුන්ගේ නිත්‍ය වැටුපෙන් අවම වශයෙන් 75% ක වන්දි මුදලක් ලැබිය යුතුය. මෙම තාවකාලික සේවය අත්හිටුවීම් ස්ථිර වුවහොත් කම්හලක් වසාදමන අවස්ථාවකට අනුකූලවද වන්දි ගෙවිය යුතුය.

ඕනෑම අවස්ථාවක, සේවයෙන් පහ කරන ලද සියලුම සේවකයින් නැවත බඳවා ගැනීම කිසිසේත්ම වෙනස් කළ නොහැකි කොන්දේසියකි. තීරුබදු ආශ්‍රිතව ගන්නා නිෂ්පාදන දාමයේ තීරණ නිසා ඇතිවන බාධා වෘත්තීය සමිති හෝ සේවක අයිතිවාසිකම් අඩපණ කිරීමේ මෙවලමක් බවට පත් නොවන බව සහතික කිරීම සඳහා වෙළඳ නාම සෘජු වගකීම දරයි. ඇඟලුම් සේවකයින්ව කිසි විටෙකත් අතහැරදැමිය හැකි යමක් ලෙස නොසැලකිය යුතුය.

සමබර, සාධාරණ සහ තිරසාර ආර්ථික හා සමාජ සංවර්ධනයට සහාය වීම සඳහා සහ සියලු ආකාරයේ වෙළඳපල අසාධාරණයන්ට එරෙහිව තනි පෙරමුණක් ගොඩනැගීම සඳහා ශ්‍රමයට වෙළඳපල සම්බන්ධයෙන් ඉදිරිදර්ශනයක් තිබිය යුතුය. එවැනි ඉදිරිදර්ශනයක අඩංගු මූලධර්ම දෙකක් විය යුත්තේ:

i. සියලුම රටවල් අතර කාර්මික පදනමේ සමතුලිත සංවර්ධනය,
ii. ගෝලීය නිෂ්පාදන ජාලයන් මත බදු පැනවීමෙන් ජනනය වන ආදායම තිරසාර හා සාධාරණ ලෙස බෙදා හැරීමයි.

සූරාකෑම මත ගොඩනගා ඇති ගෝලීය වෙළඳ ව්‍යුහය අපි ප්‍රතික්ෂේප කරමු, එය වෙළඳ නාමවලට බිලියන ගණනින් ප්‍රතිලාභ ලබා දෙන අතරම සේවකයින් - බොහෝ දුරට කාන්තාවන් - දරිද්‍රතාවයට හා ණය බරට තල්ලු කරයි. ගෝලීය වෙළඳාමේ නීති, ස්වල්ප දෙනෙකු සඳහා ධනය උත්පාදනය කිරීම පමණක් නොව, කම්කරුවන් එහි හරය බවට පත් කරන ආකාරයට නැවත ලිවීමට කාලය පැමිණ තිබේ. ගෝලීය ඇඟලුම් කර්මාන්තය යුක්තිය, සාධාරණත්වය සහ වගවීම මත මුල් බැස ගත යුතුය.

අඩු වැටුප් සහිත ශ්‍රමයෙන් ලාභ ලැබීමටත්, අර්බුදයක් ඇති වූ විට අතුරුදහන් වීමටත් වෙළඳ නාමවලට ඉඩ නොදිය යුතුය. රජයන් මිනිස් ජීවිත බිල්ලට දෙමින් වෙළඳපල ආයුධයක් බවට පත් නොකළ යුතුය. ආසියා කම්කරු ව්‍යාපාරය සමග නැඟී සිටින ලෙස ගෝලීය කම්කරු ව්‍යාපාරයෙන් අපි ඉල්ලා සිටිමු - මන්දයත් කම්කරු පන්තියේ එක් කොටසකට පහර දෙන විට, සමස්ත පන්තියම තර්ජනයට ලක්වන බැවිනි. බලාත්මක සන්නාම බැඳීම්, වෙළඳ ආදායම කම්කරුවන් වෙත යලි බෙදා හැරීම සහ වෙලඳපළ සූරාකෑමට එරෙහිව එක්සත් පෙරමුණක් හරහා, අපි පෙරළා සටන් කරන්නෙමු. ඊට අඩු ඕනෑම දෙයක් පාවාදීමකි, වත්මන් තත්වයට අනුබල දීමකි.